# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,032 - 2017 අගෝස්තු මස 11 වැනි සිකුරාදා - 2017.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුව**

අගවිනිසුරු නිල නිවසේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ
අරක්කැමි තනතුර සඳහා පහත සුදුසුකම් ඇති ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

අගවිනිසුරු නිල නිවසේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ අරක්කැමි තනතුර සඳහා විවෘත පදනම මත සුදුස්සන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2017.08.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ "රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ 12." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. එම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III වන ශ්‍රේණියේ අරක්කැමි තනතුර සඳහා බඳවා ගැනීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :
වයුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-
ඉදිරියේදී රජය විසින් ගනු ලබන තීරණවලට යටත්ව ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය.

03. වැටුප් පරිමාණය :
අංක 03/2016 හා 2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III, II හා I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය PL 1-2016 - රු. 24,250 - 10x250-10x270-10x300-12x330- රු. 36,410/- ක් වේ. රු. 27,020/- න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස්වීම ද රු. 29,750/- න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස්වීම ද, රු. 32,780/- න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස්වීම ද ලබාගත යුතු ය.

04. සුදුසුකම් :-
4.1 අධ්‍යාපන සුදුසුකම් :-
අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයයන් 06 ක් සමත්ව තිබීම
4.2 වෘත්තීය සුදුසුකම් :- විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.
4.3 පළපුරුද්ද :- විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

05. වයස් සීමාව :-
2017.08.25 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

06. වෙනත් සුදුසුකම් :-
(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
(ආ) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු යි.
(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතු ය.
සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :-
වයුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේ දී ම පැවැත්වෙන වයුහගත සම්මුඛ පරීක්ෂණයකදී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍යය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර, වයුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

වයුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ :-

| | *පරීක්ෂාකර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදළ නොවේ. |
| 02 | වෘත්තීය සුදුසුකම් | 20 | |
| 03 | භාෂා දැනුම | 10 | |
| 04 | පරිගණක දැනුම | 15 | |
| 05 | පළපුරුද්ද | 40 | |
| 06 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා | 05 | |
| | එකතුව | 100 | |

සටහන .- තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු යි.

08. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :-

| | භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාව |
|---|---|---|
| 01 | රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 02 | අනෙකුත් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදළ වන මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

09. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනීගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

11. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියේ අරක්කැමි තනතුර සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කරන්න.

12. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් විසින් වයුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

I පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
II වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

රෙජිස්ට්‍රාර් - ශ්‍රේෂ්ඨාධිකරණය.

2017 අගෝස්තු මස 01 වැනි දින.
ශ්‍රේෂ්ඨාධිකරණ කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියට බඳවා ගැනීම

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

සේවය කිරීමට මනාපය දක්වන අමාත්‍යාංශය :————.
දෙපාර්තමේන්තුව :————.
අයදුම්කරන තනතුර :————.

1. මුලකුරු සමග නම :————.
2. සම්පූර්ණ නම :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :
4. ස්ථිර ලිපිනය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අගෝස්තු මස 31 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 අගෝස්තු මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

6. උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

7. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

8. අධ්‍යාපන සුදුසුකම් :

I අ.පො.ස. (සා.පෙළ) පළමුවර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II අ.පො.ස. (සා.පෙළ) දෙවනවර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.1 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

09. වෙනත් සුදුසුකම් :————.

10. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :————.
11. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් :————.
12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :————.
(අදාළ කොටුවේ ✓ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.
(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08-621

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2017)**

**Second Efficiency Bar Examination for Grade 1 Statistical Officers in the Department of Census and Statistics - 2013 (2017)**

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරී තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු* : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම වාර දෙකක දී හෝ පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට හෝ පළමුවරට පෙනී සිටින අපේක්ෂකයින්ගේ ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයක් සඳහා රු.250 ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු.500 විභාග ගාස්තුවක් ද අයකෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතු ය. මෙම විභාග ගාස්තුවට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත්‍ර* : අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්රුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2017 සැප්තැම්බර් 11 දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය*: අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑමවිෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් කුමක් වුව ද, භාරගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියකියවිල්ලක් ඉදිරිපත් කල නොහැකි අයදුම්කරුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

06. අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීමද ප්‍රතිඵලදායී වනු ඇත.

06.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳ සලකනු නොලැබේ.

06.2 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන් ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ශාලාධිපති වෙත භාර දිය යුතු ය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍යද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම් රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයන් සඳහා එකම භාෂා මාධ්‍යකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත් වේ.

10. *විභාග පටිපාටිය*

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| | *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 2. | මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 1 | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | මේ සඳහා ආයතන සංග්‍රහයේ XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII යන පරිච්ඡේද සහ එම පරිච්ඡෙද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානයට ගතයුතු වේ. |
| 2 | මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. :<br>➢ VI වන පරිච්ඡෙදය - ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරීත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම් රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව, බැංකු ගිණුම් (මු.රෙ. 315 සිට 396 දක්වා)<br>➢ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය 2006 - භාණ්ඩ හා වැඩ යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය. |

සටහන :
➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකි ය.
➢ නියමිත කාලය තුළදී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසු යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.
12. මෙම ගැසට් නිවේදනය මගින් විධිවිධාන සලකා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.
13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත් වේ.

ආචාර්ය ඒ. ජේ. සතරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන
දෙපාර්තමේන්තුව,
අංක 306/71,
සංඛ්‍යාන මන්දිරය,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2017)**
Second Efficiency Bar Examination for Grade 1 Statistical Officers in the Department of Census and Statistics - 2013 (2017)

☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HEARTH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)
2.2 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 දුරකථන අංකය : | | | | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. ස්ත්‍රී/ පුරුෂ භාවය
පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත් වන විෂයය/ විෂයයන්

| අනු. අංකය | විෂයය | විෂය අංකය |
|---|---|---|
| 01. | | |
| 02. | | |

06. උපන් දිනය :

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

07. දැනට දරන තනතුර :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාළ නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය :*
ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් ............... ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

**සටහන** - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

10. අත්සන සහතික කිරීම :
මගේ දෙපාර්තමේන්තු නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................. .......................... මයා/ මිය/ මෙනවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

08- 360/1

---

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2017)

## 1st Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics - 2013 (2017)

01. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරි තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සංඛ්‍යාලේඛන නිලධාරි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2017 නොවැම්බර් මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.
(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනවා ඇත.

03. *විභාග ගාස්තු.*- විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම පෙනී සිටිය හැකිය. සම්පූර්ණ විභාග යට හෝ ඉන් කොටසකට හෝ පළමුවරට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන්පසු පෙනී සිටින ඕනෑම වාරයක දී එක් විෂයක් සඳහා රු.250 ක විභාග ගාස්තුවක් ද සම්පූර්ණ විභාගය සඳහා රු.500 විභාග ගාස්තුවක් ද අයකෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ ඇලවිය යුතු ය. මෙම විභාග ගාස්තුවට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. (විභාග ගාස්තු ගෙවා ලබාගන්න ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත්‍රය.*-අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. මෙම ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 05 තෙක් පළමුවන පිටුවටත් ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2017 සැප්තැම්බර් 11 දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ.1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.*-අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් කුමක් වුවද, භාරගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේතුවේ කොමසාරිස් විසින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශීය ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියකියවිල්ලක් ඉදිරිපත්කළ නොහැකි අයදුම්කරුගේ අපේක්ෂකත්වය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

06. අයදුම්පත් යොමුකර ඇති අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියා පදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු වේ නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

06.1 විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳ සලකනු නොලැබේ.
06.2 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. අයදුම්කරුවන් ප්‍රවේශ පත්‍රයේ තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා හෝ සහතික කරවා ගත යුතු ය.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයෙකු නම් රාජ්‍ය සේවයට ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියලුම විෂයන් සඳහා එකම භාෂා මාධ්‍යකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත් වේ.

10. විභාග පටිපාටිය.

ඉහත තනතුරුවලට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1. | මූලික සංඛ්‍යාන ක්‍රම | පැය 2 | 100 | 40% |
| 2. | කාර්යාල පාරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| 2. | මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 1 | මූලික සංඛ්‍යාන ක්‍රම | දත්ත එක්රැස් කිරීම හා ඉදිරිපත් කිරීම, t ව්‍යාප්ති, ප්‍රථම ව්‍යාප්ති, t කල්පිත පරීක්ෂා මූලධර්ම හා $x^2$ පරීක්ෂා, ජාල රේඛය හා සංඛ්‍යාත චක්‍ර කේන්ද්‍රියක ප්‍රවණතාවය හා අපකිරණයේ මිනුම් (මාතය, මධ්‍යස්ථය, මධ්‍යන විචලතාවය, චතුර්ථක හා සම්මත අපගමනය, නියදුම්වාදයේ මූලධර්ම, නියදුම් සමීක්ෂණය, නියැදුම් දෝෂය, හා නොනියැදුම් දෝෂය, දර්ශක අංක, සරල සහසම්බන්ධතාවය, රේඛීය ප්‍රතිපායනය සහ සංඛ්‍යාන විද්‍යා මූලික දැනුම). |
| 2. | කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | ➢ මේ සඳහා ආයතන සංග්‍රහයේ II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX යන පරිච්ඡේද සහ එම පරිච්ඡේද සංශෝධනය කරන ලද චක්‍රලේඛ පිළිබඳව ද අවධානය ගතයුතු වේ. |
| 3. | මුදල් රෙගුලාසි | මෙය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>➢ I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු, ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මු.රෙ. 1 සිට 68 දක්වා)<br>➢ III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායි බව, ප්‍රධාන ගණක නිලධාරීන්, ගණක නිලධාරීන්, ආදායම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම (මු.රෙ. 124 සිට 147 දක්වා) |

සටහන -
➢ ඉහත විෂයයන්ට වෙන වෙනම පෙනී සිටිය හැකි ය.
➢ නියමිත කාලය තුළ දී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසු යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතු වේ.

11. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත්කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.
12. මෙම ගැසට් නිවේදනය මගින් විධිවිධාන සලකා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.
13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත් වේ.

ආචාර්ය ඒ. ජේ. සතරසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන
දෙපාර්තමේන්තුව,
අංක 306/71,
සංඛ්‍යාන මන්දිරය,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සංඛ්‍යාලේඛන නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2013(2017)
First Efficiency Bar Examination for Grade II Statistical Officers in the Department of Census and Statistics
- 2013 (2017)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා :- GUNAWARDHANA, H.M.S.K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. 2.1 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)
2.2 කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම සහ ලිපිනය :————.
(සිංහලේ/දෙමළෙන්)
2.3 පෞද්ගලික ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 දුරකථන අංකය :

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. ස්ත්‍රී/ පුරුෂභාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ඔබ මෙවර විභාගයේ දී ඉදිරිපත්වන විෂයය/ විෂයයන් :

| *අනු. අංකය* | *විෂයය* | *විෂය අංකය* |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |

06. උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

07. දැනට දරන තනතුර :
7.1 තනතුර :————.
7.2 පත්වීම් ලිපියේ අංකය :————.

08. 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද?:————.
8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
8.3 ලදුපත් අංකය :————.
8.4 දිනය :————.

ලදුපත මෙහි අලවන්න. (අදාල නම් පමණි).
(ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

09. *අයදුම්කරුගේ ප්‍රකාශය* :
ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් .............. ගෙවා ලබාගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟවන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

10. අත්සන සහතික කිරීම :
මගේ දෙපාර්තමේන්තුවේ නිලධාරියකු / නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන........... ...................... මයා/ මිය/ මෙනවිය .......................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂාකර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

08- 360/2

---

**සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

සිසු හෙද පුහුණුවට බඳවාගැනීම - 2017 වර්ෂය

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීමට අංක 1837/8 හා 2013.11.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථාවට හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පිරිමි අයදුම්කරුවන් බඳවාගැනීම හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල අවශ්‍යතා පදනම්කර ගනිමින් සිදුකරනු ලැබේ.)

*සටහන* .-2016 වර්ෂයට අදාළව සිසු හෙද පුහුණුවට අයදුම්කර මේ වන විට www.health.gov.lk වෙබ් අඩවියේ තෝරාගත් ලෙස නම සඳහන්වන සිසුන් මෙම චක්‍රලේඛය යටතේ නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවන බව සැලකිය යුතුය.

01. මෙහි දී දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
ඉන් පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම් කර සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
ඉන්පසු එම එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ජෛවීය විද්‍යා විෂය ධාරාව හා භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ අයදුම්කර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂවලට අදාළව එක් එක් විෂයධාරා යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
එලෙස එක් එක් වර්ෂයෙන් එක් එක් විෂය ධාරාව යටතේ බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කර එම සංඛ්‍යාවෙන් 5% පිරිමි අයදුම්කරුවන්ගෙන් ද 95% ගැහැණු අයදුම්කරුවන්ගෙන් ද සමන්විත වන ලෙස එක් එක් වර්ෂයන් හි එක් එක් විෂයධාරා යටතේ දිස්ත්‍රික්කයේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතුරින් පුහුණුවට බඳවා ගනු ලැබේ.

02. මෙම පාඨමාලාවන් පූර්ණ කාලීන පාඨමාලාවන් වේ. එබැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන ආයතනයක හෝ පූර්ණ කාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම්කර පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/ තනතුරෙන් ඉවත්කර ඒ වන තෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරන ලද සියලුම වියදම් අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරන අයකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම් ඔවුන් පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය.

2.1 2017.08.31 වැනි දින වන විට ඔබ කුමන හෝ විශ්ව විද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි ව සිටියේ නම් හෝ සිටින්නේ නම් සිසු හෙද පුහුණුව සඳහා තේරී පත්වුවහොත් හෙද පුහුණුව සඳහා හෙද විදුහලේ ලියාපදිංචි කරන දිනට පෙර අදාළ පුහුණුවෙහි හෝ පාඨමාලාවෙහි ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය.

2.2 2017.08.31 දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද යම් හෙයකින් සිසුහෙද පුහුණුවට අභ්‍යාසලාභීන් ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචිව සිටියේ නම් ඔහු ද සිසු හෙද පුහුණුවේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය.

2.3 සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයදුම්කරුවන් වේ නම් ඔවුන් සිසු හෙද පුහුණුවට තේරී පත්වුවහොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව අත්සන් කර තිබෙන ගිවිසුම්වලට අනුව ගිවිසුම් ගත මුදල හා ඒ වනවිට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදාළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් සිසු හෙද පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

*සැළකිය යුතුය* :

1. ඉහත 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පුහුණුව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

2. එමෙන්ම ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද 2.1 සිට 2.3 දක්වා සඳහන් කොන්දේසි සපුරා නොමැති නම් කිසිදු අයුරකින් මෙම පුහුණුව සඳහා ලියාපදිංචි කරනු නොලැබේ.

03. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) 2015 හා 2016 වර්ෂයන්හි කුමන හෝ වර්ෂයක, අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ජෛවීය විද්‍යා විෂයය ධාරාවට අයත්, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් 03ක් හදාරා සියලුම විෂයයන්ගෙන් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර);

*හෝ*

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, හා උසස් ගණිතය යන විෂයයන් අතුරින් විෂයන් 03ක් හදාරා සියලුම විෂයයන්ගෙන් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

*සහ*

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

04. *අනෙකුත් සුදුසුකම්* :

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය;
(ආ) 2017.08.31 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 28ට නොවැඩි විය යුතු ය;
(ඇ) උස අඩි 04 අඟල් 10 (147.3 cm) ට නොඅඩු විය යුතු ය.
(ඈ) අවිවාහක විය යුතු ය.
(ඉ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෙද නිලධාරියෙකු ලෙස සේවය ලබාදීම සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍යය විය යුතු ය.
(ඊ) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
(උ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(ඌ) ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය.

(එ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2017.08.31 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. පදිංචිය සනාථ කිරීමට පහත කරුණුවලින් එකක් සපුරා තිබිය යුතු අතර, අදාළ ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ ඉදිරිපත් කළ යුතු ය. :

(i) 2017.08.31 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් තුළ ඔහු එම දිස්ත්‍රික්කය තුළ අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. (මෙහිදී ප්‍රාදේශීය ලේකම් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතු ය).
(ii) දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් ලබාගත් පූර්වාසන්න වසර 03ක ඡන්දහිමි නාම ලේඛනවල උපුටන ඉදිරිපත් කළ යුතු ය.

05. *අයදුම් කළ යුතු ක්‍රමය* :

(අ) මෙම නිවේදනය අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතු වේ.
ආදර්ශ අයදුම්පතේ දක්වා ඇති අංක 01 සිට අංක 09 දක්වා වගන්ති 01 පිටුවේ ද, අංක 10 වගන්තිය 02 වැනි පිටුවේ ද, අංක 11 සිට අංක 13 දක්වා වගන්ති 03 වැනි පිටුවේ ද වන පරිදි අයදුම්පත් සකස් කළ යුතු වේ. තව ද අයදුම්පතේ ඉහළ දකුණු කෙළවරේ කොටුවේ අදාළ තොරතුරු අනිවාර්යයෙන්ම ඇතුළත් කළ යුතු ය.

**සටහන** :- ඉහත (3) හා (4) යටතේ දැක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2017.08.31 වැනි දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ආ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ අනිවාර්යයෙන්ම "සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2017" ලෙස හා පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කොට 2017.08.31 වැනි දිනට පෙර "අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරි සේවයේ/රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වාර්ෂිකව රු. 2,40,360 ට නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතු වේ.
(ඈ) අයදුම්කරුවන් රු. 300ක මුදලක් ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට බැරකර අදාළ ලදුපත් අයදුම්පතෙහි කොටුව තුළ ඇලවිය යුතු ය. එම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති, බැංකු ලදුපත අලවා නොමැති හා 2017.08.31 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බව ද දන්වා එවනු නොලැබේ.

07. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

**සටහන** :-
(අ) හෙද විදුහල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවා ගතයුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.
(ආ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර, එසේ තේරුම් ගත යුතු ද නොවේ.
(ඇ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ, නුසුදුසු වූ හා තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පළකරනු ලබන අතර, කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

08. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා එම ලේඛනවල තමා විසින් සත්‍ය බවට සහතික කරන ලද පිටපත් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක් භාරගනු නොලැබේ.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අ. පො. ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය;
(ඇ) අ. පො. ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකය;
(ඈ) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියැදුරු බලපත්‍රය;
(ඉ) ඉහත 4 (එ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන;
(ඊ) අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්.

***සටහන*** :-ඉහත අ, ආ, ඇ, ඈ යටතේ දැක්වෙන සහතිකවල සත්‍ය බවට තමා විසින් සහතික කරන ලද පිටපත් අයදුම්පත සමග ද එවිය යුතු ය.

09. *පුහුණු කිරීමේ පරිපාටිය* :

(අ) තෝරාගත් අයදුම්කරුවන් සිසු හෙද/හෙදියන් වශයෙන් හෙද පුහුණු පාසැල්වලට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් විසින් අවුරුදු 03 ක පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරිය යුතු වේ.
(ආ) පුහුණුව සඳහා ලියාපදිංචි වන අභ්‍යාසලාභීන් හෙද පුහුණු පාසැල්වල බලපැවැත්වෙන නීතිරිති මාලාවට යටත් වේ. මෙම නීතිරීතිවලට හා කලින් කල පනවනු ලබන වෙනත් නීතිරීතිවලට ද ඔවුන් යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන හෝ පුහුණුවට බඳවා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙළිවුවහොත් හෝ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය. පුහුණු කාලය තුළ දී අභ්‍යාසලාභීන් කිසිම ආකාරයක නිවාඩුවකට හිමිකම් නොලබන අතර, පුහුණුව සඳහා නොපැමිණෙන දින වෙනුවෙන් දීමනාවෙන් සමානුපාතික මුදලක් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් විභාගයට පෙනී සිටීම සඳහා සෑම වර්ෂයකම 80%ක පැමිණීම අනිවාර්ය වේ.

(ඈ) හෙද විද්‍යාලක පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 විධිවිධානවලට අනුකූලව සිසු හෙද/හෙදියන්ට ලබාදෙන මාසික දීමනාව ලබා දෙනු ඇත.

(ඉ) පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත්වුවහොත් හෝ ඉවත්කළහොත් හෝ පුහුණුව හැර ගියහොත් ගිවිසුම්ගත මුදල පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනා හා රජය විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු හෝ ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. එසේ නොවුවහොත් එම මුදල අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

10. විවාහ නොවීමේ කොන්දේසි හා ගිවිසුම :

(අ) සියලුම අයදුම්කරුවන් ඉල්ලුම්පත්‍ර එවන දිනය වන විට අවිවාහකව සිටිය යුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්ය වේ. අවිවාහක බව සනාථ කිරීම සඳහා සියලුම අයදුම්කරුවන් විසින් සාමදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ දී අත්සන් තබන ලද දිවුරුම් ප්‍රකාශයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ.

(ආ) සිසු හෙද/හෙදියන් හෙද පුහුණු පාසලට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව පත්වීමක් ලබාදෙනු ලැබුවහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාල පරිච්ඡේදයක් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හෝ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයක් යටතේ ඇති රෝහලක සේවය කරන බවටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ඇපකරයකට හා ගිවිසුමකට එළඹිය යුතු ය. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම කාල පරිච්ඡේදය කලින් කලට නිශ්චය කරනු ඇත.

11. සේවා කොන්දේසි :

(අ) සියලුම අභ්‍යාසලාභීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීම අවශ්‍ය වේ.

(ආ) පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. තුන් අවුරුදු පුහුණුව සාර්ථකව නිමකර අවසන් විභාගයෙන් සමත්වන සිසු හෙද/හෙදි අභ්‍යාසලාභීන් සඳහා ස්ථිර පත්වීම් ලබා දීමට රජය අපේක්ෂා කළහොත් ඔවුන් 2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානවලට අනුව MT-07-2016 වැටුප් පරිමාණය මත III ශ්‍රේණියේ මාණ්ඩලික හෙද තනතුරුවල පවත්නා පුරප්පාඩු සඳහා පත්කරනු ලැබේ.

(ඇ) හෙද සේවයේ සියලුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, හෙද සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද යටත් වනු ඇත.

(ඈ) අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ඉතා සැළකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඒ දෙනු ලබන පත්වීම් අවලංගු කර පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර, නැවත රජයේ සේවයට නොග න්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ /ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියදම් හා ගිවිසුම්ගත මුදල ඔහුගෙන්/ඇයගෙ න් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී.

(ඊ) මෙම පුහුණු කාල සීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදු කළ බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සිදු කරනු ඇත.

| 19 | 1510 | ඇලුමිනියම් මුට්ටි | 02 |
| 20 | 2039 | ඇලුමිනියම් කල | 01 |
| | | තඹ දඟර | 01 |
| 21 | 2127 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 22 | 2532 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 23 | 2564 | ඇලුමිනියම් කල | 01 |
| | | ඇලුමිනියම් හට්ටි | 01 |
| | | තඹ දඟර | 01 |
| 24 | 2864 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 25 | AR 269/17 | තඹ දඟර | 01 |
| 26 | AR 282/17 | තඹ දඟර | 01 |
| 27 | AR 296/17 | තඹ දඟර | 01 |
| 28 | 3189 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| | | ඇලුමිනියම් හට්ටි | 01 |
| 29 | 3208 | තඹ දඟර | 01 |
| 30 | 3207 | ගෑස් සිලින්ඩර් | 01 |
| | | තඹ දඟර | 01 |
| 31 | 3255 | තඹ දඟර | 01 |
| | | ඇලුමිනියම් කුඩා බොයිලේරු | 01 |
| 32 | 113 | සවල් | 02 |
| 33 | 116 | සවල් | 01 |
| 34 | 447 | ගල් කටු | 05 |
| | | කුලුගෙඩි | 01 |
| | | යකඩ මිටි | 01 |
| | | උදලු තල | 02 |
| | | යකඩ බාල්දි | 01 |
| 35 | 289 | අලවංගු | 01 |
| | | ඇලුමිනියම් කේතල | 01 |
| 36 | 189 | M 48 දිග නයිලෝන් කඹ | 01 |
| | | විදුලි පන්දම් 02 යි | 02 |
| 37 | 377 | සවල් | 01 |
| 38 | 378 | සවල් | 01 |
| 39 | 379 | සවල් | 01 |
| 40 | 383 | සවල් | 02 |
| 41 | 457 | සවල් | 02 |
| 42 | 484 | සවල් | 01 |
| 43 | 517 | වයර් m 34 w 100 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 44 | 516 | වයර් m 50 w 100 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 45 | 515 | වයර් m 42 w 60 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 46 | 513 | වයර් m 82 w 100 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 47 | 514 | වයර් m 35 w 60 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 48 | 523 | වයර් m 50 180 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 49 | 524 | වයර් m 182 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 50 | 613 | සවල් | 02 |
| 51 | 840 | සවල් | 01 |
| 52 | 845 | සවල් | 01 |
| 53 | 909 | සවල් | 01 |
| 54 | 910 | සවල් | 01 |
| 55 | 908 | සවල් | 01 |
| 56 | 928 | බාල්දි | 01 |
| 57 | 929 | සවල් | 01 |
| 58 | AR 240/16 | තැටි නඟුල් | 01 |
| 59 | 967 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 60 | 1000 | වයර් m 17 w. 75 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 61 | 1001 | වයර් m 34 w 60 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 62 | 913 | අත් පොරොව | 01 |
| 63 | 1030 | සවල් | 01 |
| 64 | 1010 | වයර් m 22 w 40 බල්බ් | 01 |
| | | හෝල්ඩර් | 01 |
| 65 | 1004 | හෝල්ඩර් | 02 |
| | | වයර් m | 01 |
| 66 | 1090 | සවල් | 05 |
| | | උදලු තල | 01 |
| 67 | 1100 | සවල | 01 |
| 68 | 977 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 69 | 1193 | අලවංගු | 01 |
| | | උදලු | 01 |
| 70 | 1224 | සවල් | 01 |
| 71 | 1223 | සවල් | 01 |
| 72 | 1230 | සවල් | 02 |
| | | බාල්දි | 01 |
| 73 | 1384 A | උදලු | 01 |
| | | අලවංගු | 01 |
| 74 | 1278 | සවල් | 02 |
| 75 | 1319 | සවල් | 03 |
| 76 | 1320 | සවල් | 02 |
| 77 | 1259 | බාල්දි | 01 |
| 78 | 1331 | යකඩ බාල්දි | 01 |
| 79 | 1343 | සවල් | 01 |
| 80 | 1465 | සවල් | 02 |
| 81 | 1476 | සවල් | 02 |
| 82 | 1524 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 83 | 1719 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 84 | 1750 | සවල් | 02 |
| 85 | 1533 | සවල් | 01 |
| 86 | 1534 | සවල් | 01 |
| 87 | 1912 | සවල් | 01 |
| 88 | 1958 | සවල් | 02 |
| 89 | 1954 | සවල් | 03 |
| | | බාල්දි | 03 |
| 90 | 1956 | සවල් | 02 |
| 91 | 1955 | සවල් | 02 |
| 92 | 1957 | සවල් | 03 |
| | | බාල්දි | 01 |
| 93 | 2010 | සවල් | 02 |
| 94 | 1344 | සවල් | 01 |
| 95 | 1802 | සවල් | 02 |
| | | උදලු තල | 02 |
| 96 | 2148 | මන්න පිහිය | 01 |
| 97 | 2128 | සවල් | 02 |
| 98 | 2133 | සවල් | 03 |
| 99 | 2134 | සවල් | 03 |
| | | බාල්දි | 04 |
| 100 | 1405 | බාල්දි | 01 |
| 101 | 1122 | සවල් | 01 |
| 102 | 1123 | සවල් | 01 |
| 103 | 2138 | සවල් | 01 |
| 104 | 2149 | පිහියා | 01 |
| 105 | 2187 | සවල් | 01 |
| 106 | 2200 | සවල් | 02 |
| 107 | 2258 | සවල් | 02 |
| 108 | 2291 | සවල් | 04 |
| 109 | 2289 | සවල් | 01 |
| 110 | 2307 | සවල් | 03 |
| | | බාල්දි | 01 |
| 111 | 2318 | සවල් | 01 |
| 112 | 2364 | සවල් | 04 |
| 113 | 1965 | වේවැල් කුඩ | 02 |
| | | සවල් | 01 |
| 114 | 2341 | සවල් | 01 |
| 115 | 2461 | සවල් | 02 |
| | | බාල්දි | 03 |
| 116 | 2466 | සවල් | 01 |
| 117 | 2484 | සවල් | 03 |
| | | බාල්දි | 06 |
| 118 | 2483 | බාල්දි | 01 |
| 119 | 2487 | බාල්දි | 01 |
| 120 | 2486 | බාල්දි | 01 |
| 121 | 2485 | බාල්දි | 01 |
| 122 | 2495 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 123 | 2581 | සවල් | 01 |
| | | උදලු | 01 |
| 124 | 2580 | සවල් | 01 |
| 125 | 2610 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 126 | 2633 | බාල්දි | 01 |
| 127 | 1113 | සවල් | 01 |
| 128 | 1097 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 129 | 2696 | සවල් | 02 |
| | | බාල්දි | 02 |
| 130 | 2722 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 131 | 2723 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 132 | 2748 | සවල් | 01 |
| 133 | 2815 | සවල් | 04 |
| | | වේවැල් කුඩ | 04 |
| | | බාල්දි | 02 |
| 134 | 2820 | සවල් | 02 |
| | | බාල්දි | 01 |
| 135 | 2781 | සවල් | 01 |
| | | කුඩ | 01 |
| 136 | 2834 | සවල් | 03 |
| 137 | 2930 | බාල්දි | 01 |
| 138 | 2929 | බාල්දි | 01 |
| 139 | 2928 | බාල්දි | 01 |
| 140 | 2927 | බාල්දි | 01 |
| 141 | 2926 | බාල්දි | 01 |
| 142 | 2924 | බාල්දි | 01 |
| 143 | 2925 | බාල්දි | 01 |
| 144 | 2923 | බාල්දි | 01 |
| 145 | 2920 | බාල්දි | 01 |
| 146 | 2931 | බාල්දි | 01 |
| 147 | 2939 | සවල් | 02 |
| 148 | 3124 | සවල් | 01 |
| | | බාල්දි | 01 |
| 149 | 3165 | සවල් | 01 |
| 150 | 3171 | සවල් | 01 |
| 151 | 3194 | සවල් | 01 |
| 152 | 3229 | වේවැල් කුඩ | 03 |
| | | බාල්දි | 01 |
| 153 | 3147 | බාල්දි | 01 |
| | | සවල් | 01 |
| 154 | 3150 | සවල් | 01 |
| 155 | 3148 | බාල්දි | 02 |
| 156 | 3258 | බාල්දි | 01 |
| 157 | 3269 | බාල්දි | 01 |
| 158 | 3267 | සවල් | 02 |
| 159 | 3288 | බාල්දි | 01 |
| 160 | 1010 | බල්බ් | 01 |
| | | සුදු හොල්ඩර් | 01 |
| 161 | 3325 | බාල්දි | 01 |
| 162 | 3373 | වේවැල් කුඩ | 02 |
| 163 | 3371 | වේවැල් කුඩ | 01 |
| | | බාල්දි | 01 |
| 164 | 3370 | බාල්දි | 02 |
| 165 | 3369 | බාල්දි | 01 |
| | | සවල් | 01 |
| 166 | 3445 | කුඩ | 03 |
| 167 | 3396 | බාල්දි | 02 |
| 168 | 3397 | සවල් | 02 |
| | | බාල්දි | 02 |
| 169 | 3511 | බාල්දි | 01 |
| 170 | 2306 | සවල් | 01 |
| | | බාල්දි | 02 |
| 171 | 2434 | තඹ දඟර | 01 |

08 - 252

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - ගල්කිස්ස**

ප්‍රසිද්ධ නඩු භාණ්ඩ වෙන්දේසිය - 2017

ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියම කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2017.08.26 වැනි සෙනසුරාද දින පෙ. ව. 10.00 ට ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී වෙන්දේසියෙහි විකුණනු ලැබේ.

ලේඛනයෙහි සඳහන් නඩු භාණ්ඩ අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරියගේ අවසරය මත එදින වෙන්දේසිය ආරම්භ වීමට පැය භාගයකට ප්‍රථම ගැනුම් කරුවන්ට පරීක්ෂා කළ හැකි ය.

අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව පිළිනොගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි අදල භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර ම සියලුම ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතු ය.

මෙහි උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැදුනුම්පත ඉදිරිපත් කළ යුතු වේ.

එම්. එම්. එම්. මිහාල්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
ගල්කිස්ස.

2017 ජූලි මස 26 වැනි දින,
ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | A 2429/14 | පා පැදිය |
| 02. | A 1341/16 | පා පැදිය |
| 03. | A 1177/16 | පා පැදිය |
| 04. | A 1341/16 | පා පැදිය |
| 05. | A 1341/16 | පා පැදිය |
| 06. | A 0176/16 | පා පැදිය |
| 07. | A 1341/16 | පා පැදිය |
| 08. | A 1341/16 | පා පැදිය |
| 09. | A 1089/16 | පා පැදිය |
| 10. | A 1341/16 | පා පැදිය |
| 11. | A 1341/16 | පා පැදිය |
| 12. | A 1083/17 | පා පැදිය |
| 13. | A 1083/17 | පා පැදිය |
| 14. | A 1068/16 | පා පැදිය |
| 15. | A 1176/16 | පා පැදිය |
| 16. | A 877/17 | පා පැදිය |
| 17. | A 1177/16 | පා පැදිය |
| 18. | A 614/17 | පා පැදිය |
| 19. | A 612/17 | පා පැදිය |
| 20. | අංක රහිත | පා පැදිය |
| 21. | අංක රහිත | පා පැදිය |
| 22. | අංක රහිත | පා පැදිය |
| 23. | අංක රහිත | පා පැදිය |
| 24. | අංක රහිත | පා පැදිය |
| 25. | අංක රහිත | පා පැදිය |
| 26. | අංක රහිත | පා පැදිය |
| 27. | අංක රහිත | පා පැදිය |
| 28. | අංක රහිත | පා පැදිය |
| 29. | අංක රහිත | පා පැදිය |
| 30. | අංක රහිත | අබලන් පාපැදිය |
| 31. | අංක රහිත | අබලන් පාපැදිය |
| 32. | අංක රහිත | අබලන් පාපැදිය |
| 33. | අංක රහිත | අබලන් පාපැදිය |
| 34. | අංක රහිත | අබලන් පාපැදිය |
| 35. | අංක රහිත | අබලන් පාපැදිය |
| 36. | අංක රහිත | අබලන් පාපැදිය |
| 37. | අංක රහිත | අබලන් පාපැදිය |
| 38. | අංක රහිත | අබලන් පාපැදිය |
| 39. | අංක රහිත | අබලන් පාපැදිය |
| 40. | අංක රහිත | අබලන් පාපැදිය |
| 41. | අංක රහිත | අබලන් පාපැදිය |
| 42. | අංක රහිත | අබලන් පාපැදිය |
| 43. | අංක රහිත | අබලන් පාපැදිය |
| 44. | අංක රහිත | අබලන් පාපැදිය |
| 45. | A 1071/17 | කාර් කැසට් 01 |
| 46. | A 1071/17 | කාර් කැසට් 01 |
| 47. | A 1071/17 | කාර් කැසට් 01 |
| 48. | A 1124/17 | ඇලුමිනියම් සාස්පාන් 03 |
| 49. | A 1124/17 | නිල් පාට වීල්බැරෝ 01 |
| 50. | A 1124/17 | කොළ පාට වීල්බැරෝ 01 |
| 51. | A 980/17 | වීල් බැරෝ 01 |
| 52. | A 721/16 | කාන්තා මුදල් පසුම්බි 01 |
| 53. | A 978/17 | විදුලි කියත් 01 |
| 54. | A 977/17 | ග්‍රයින්ඩර් 01 |
| 55. | A 977/17 | කැරම් බෝඩ් 01 |
| 56. | A 977/17 | රූපවාහිනී 01 |
| 57. | A 980/17 | ටයිල් කැට 52 |
| 58. | A 980/17 | ඇලුමිනියම් ඉනිමං 01 |
| 59. | A 980/17 | යකඩ ඉනි 01 |
| 60. | A 980/17 | පාවිච්චි කරන ලද උදලු 01 |
| 61. | A 980/17 | පාවිච්චි කරන ලද සවල් 01 |
| 62. | A 981/17 | කුකුලා පහන් 01 |
| 63. | A 982/17 | යකඩ ඉනි 01 |
| 64. | A 982/17 | දඬු අඬු 01 |
| 65. | A 982/17 | වතුර මෝටර් 01 |
| 66. | A 526/12 | කුකුළා පහන් කොටස් 02 |
| 67. | B 4257/06 | සල්වාර් 240 |
| 68. | A 983/17 | ගෑස් සිලිංඩර් 01 |
| 69. | A 984/17 | කුඩා ගෑස් සිලින්ඩර් 01 |
| 70. | 71068/13 (B 45) | ගෑස් සිලිංඩර් 01 |
| 71. | 93366/17 | ගෑස් සිලිංඩර් 01 |
| 72. | A 983/17 | කුඩා ගෑස් සිලින්ඩර් 01 |
| 73. | A 984/17 | රෙගියුලේටර් 01 |
| 74. | 93366/17 | විවෘත ගෑස් ලිප් 01 |
| 75. | 71068/13 | ෆ්ලෑෂ් ලයිට් 01 |
| 76. | A 2195/13 | යකඩ කොටස් 01 |
| 77. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ කම්බි කූරු 105 |
| 78. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ ගැල්වනයිස් බට 15 |
| 79. | අංක රහිත | නවන ලද සිරප් කම්බි 100 |
| 80. | අංක රහිත | 1/4 ප්‍රමාණයේ කම්බි රෝල් 02 |
| 81. | අංක රහිත | ඇලුමිනියම් රෝල් 01 |
| 82. | අංක රහිත | වාහන ඇක්ෂල් කොටස් 02 |
| 83. | අංක රහිත | 3/4 වයරින් බට 60 |
| 84. | අංක රහිත | ග්‍රිල් කොටස් 02 |
| 85. | අංක රහිත | යකඩ කණු 02 |
| 86. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ ඇලුමිනියම් බාර් 15 |
| 87. | A 979/17 | ලැප්ටොප් 01 |
| 88. | A 942/16 | දම්පාට ටැබ් 01 |
| 89. | A 1073/17 | ටැබ් යන්ත්‍ර 01 |
| 90. | A 1070/17 | ජංගම දුරකථන 01 |
| 91. | A 1070/17 | ජංගම දුරකථන 01 |
| 92. | A 1070/17 | ජංගම දුරකථන 01 |
| 93. | A 1603/16 | ජංගම දුරකථන 01 |
| 94. | A 941/16 | ජංගම දුරකථන 01 |
| 95. | A 1604/16 | ජංගම දුරකථන 01 |
| 96. | A 1600/16 | ජංගම දුරකථන 01 |
| 97. | A 1600/16 | ජංගම දුරකථන 01 |
| 98. | A 1600/16 | ජංගම දුරකථන 01 |
| 99. | A 1600/16 | ජංගම දුරකථන 01 |
| 100. | A 1600/16 | ජංගම දුරකථන 01 |
| 101. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 102. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 103. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 104. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 105. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 106. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 107. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 108. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 109. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 110. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 111. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 112. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 113. | A 1073/17 | ජංගම දුරකථන 01 |
| 114. | 63635/12 | ජංගම දුරකථන 01 |
| 115. | 64642/12 | ජංගම දුරකථන 01 |
| 116. | 65698 | ජංගම දුරකථන 01 |
| 117. | 66392 | ජංගම දුරකථන 01 |
| 118. | 64853 | ජංගම දුරකථන 01 |
| 119. | 64764 | ජංගම දුරකථන 01 |
| 120. | 63236 | ජංගම දුරකථන 01 |
| 121. | 63712 | ජංගම දුරකථන 01 |
| 122. | 64669 | ජංගම දුරකථන 01 |
| 123. | 64978 | ජංගම දුරකථන 01 |
| 124. | 64389 | ජංගම දුරකථන 01 |
| 125. | 63470 | ජංගම දුරකථන 01 |
| 126. | 67104 | ජංගම දුරකථන 01 |
| 127. | 67224 | ජංගම දුරකථන 01 |
| 128. | 67439 | ජංගම දුරකථන 01 |
| 129. | 66876 | ජංගම දුරකථන 01 |
| 130. | 66826 | ජංගම දුරකථන 01 |
| 131. | 65669 | ජංගම දුරකථන 01 |
| 132. | 66827 | ජංගම දුරකථන 01 |

08-451

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියක ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

01. බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලබූ හා මෙතෙකේ හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2017.08.26 වැනි දින පෙ.ව. 10.00 ට බලපිටිය අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බනධයෙන් හිමිකම් පාන්නකු වේනම් වෙන්දේසි පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කල යුතු අතර ඒ පිළිබඳ සලකා ලැබීම සඳහා අදාල භාණ්ඩ වෙන්දේසියන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ නියමිත භාණඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාරගැනීමේදී හා මුදල් ගෙවීමේදී තම ජාතක හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේම ප.ව. 4.00 ට පෙර අධිකරණය භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

රජින්ද්‍රා ජයසූරිය,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බලපිටිය.

2017 ජූලි මස 28 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ උපලේඛනය

| නඩු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | 42637 | වතුර මෝටර් | 1 |
| 2 | 89062 | ගෑස් ලිප | 1 |
| 3 | 99901 | ගෑස් ලිප | 1 |
| 4 | 589 | ගෑස් සිලින්ඩරය | 1 |
| 5 | අංක රහිත | තාච්චි | 3 |
| 6 | අංක රහිත | සවල් | 6 |
| 7 | අංක රහිත | යකඩ කුඩ ප්‍රමාණයක් | - |
| 8 | අංක රහිත | බරනි | 1 |
| 9 | අංක රහිත | ප්ලාස්ටික් කේස් ප්‍රමාණයක් | - |
| 10 | අංක රහිත | ගල් ඉනි | 1 |
| 11 | AR.1664/16 | ෆයිබර් ඔරුවක් | 1 |
| 12 | AR.1130/16 | ෆයිබර් ඔරුවක් | 1 |
| 13 | AR.1241/16 | SPXS - 9598 දරන TVS යතුරු පැදිය | 1 |
| 14 | AR.1242/16 | SPMO -684 දරන යතුරු පැදිය | 1 |
| 15 | AR. 1245/16 | SPME - 5073 රතුපාට යතුරු පැදිය | 1 |
| 16 | AR. 1246/16 | SPMU - 4887 දරන යතුරු පැදිය | 1 |
| 17 | AR. 1196/16 | SG-WW-4239-CT 100 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 18 | AR.1197/16 | SPMK - 8790 නිල්පාට ඩිස්කවරිය | 1 |
| 19 | AR.1198/16 | SPBAI - 9542 බජාජ් ප්ලැටිනම් යතුරු පැදිය | 1 |
| 20 | AR.1199/16 | අංක 155-6257 දරන හොන්ඩා වර්ගයේ රතුපාට යතුරු පැදිය | 1 |
| 21 | AR.1201/16 | ලියාපදිංචි නොකරන ලද චැසි අංක DSVBMCOO32 එන්ජින් අංක DSGBM 008333 දරන යතුරු පැදිය | 1 |
| 22 | AR.1202/16 | ලියාපදිංචි නොකරන ලද චැසි අංක MDZSDJDZZYCH 64119 එන්ජින් අංක J EGBVH 17613 දරන බජාජ් ෆල්සර් 135 වර්ගයේ කලුපාට යතුරු පැදිය | 1 |
| 23 | AR.1127/16 | අංක SPJG 0442 දරන ලොන්සින් වර්ගයේ යතුරු පැදිය | 1 |
| 24 | AR.1129/16 | අංක 117-6239 ට්‍රේල් වර්ගයේ යතුරු පැදි | 1 |
| 25 | අංක රහිත | බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරු පැදිය | 1 |
| 26 | අංක රහිත | SPTZ-9802 ඩිස්කවරි වර්ගයේ යතුරු පැදිය | 1 |
| 27 | අංක රහිත | හොන්ඩා සුපර් කප් වර්ගයේ යතුරු පැදිය | 1 |
| 28 | 50547 | 122-5468 සුදුපාට හොන්ඩා යතුරු පැදිය | 1 |
| 29 | අංක රහිත | 83 ශ්‍රී 9852 දරන හොන්ඩා යතුරු පැදිය | 1 |
| 30 | අංක රහිත | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 1 |
| 31 | 81718 | XF - 7160 ස්කූටි වර්ගයේ යතුරු පැදිය | 1 |
| 32 | අංක රහිත | 89/9573 මේට් යතුරු පැදිය | 1 |
| 33 | 56481 | SPWU - 1940 දරන කලුපාට | 1 |
| 34 | අංක රහිත | JJ - 8507 දරන ඉෂාන් යතුරු පැදිය | 1 |
| 35 | අංක රහිත | යතුරු පැදිය | 1 |
| 36 | අංක රහිත | SPMN - 5108 කෙන්ටික් යතුරු පැදිය | 1 |
| 37 | අංක රහිත | ලොන්ෂින් වර්ගයේ යතුරු පැදිය | 1 |
| 38 | අංක රහිත | MF - 1738 පල්සර් වර්ගයේ යතුරු පැදිය | 1 |
| 39 | අංක රහිත | 132 - 5946 යමහා මෙඩ් වර්ගයේ යතුරු පැදිය | 1 |
| 40 | 93427 | SPXA - 8607 හීරෝ පල්සර් යතුරු පැදිය | 1 |
| 41 | අංක රහිත | දිරා ගිය පාපැදි කොටස් | |

08-597

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - අනුරාධපුර

### රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018 වර්ෂය

2018 වර්ෂයට පහත දැක්වෙන තැබෑරුමේ පැසුණු රා විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත් ව භාරගනු ලැබේ :-

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි,
(ii) සියලු සුරාබදු නීතිය යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

02. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක්ම රු. 2,000 ක මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමග ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමින් සියයට පහළොවකට (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ඡේදයේ සඳහන්වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර්පතක් ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ''2018 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කර 2017 සැප්තැම්බර් මස 04 වැනි දින පෙරවරු 10.30 ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය. 2017.09.04 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් අදාළ දින නියමිත වේලාවට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල් වශයෙන් නියම කරනු ලබන මුදලින් ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහි ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :-

| අනු. අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය හා කොටස | තැබෑරුම විවෘත කරන වේලාව |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | අනුරාධපුර නව නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ඡේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයාගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ගතයුතු අනුමැතිය බලය ලැබීමේ අනුමැතිය ආරම්භ වීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වන විට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ය.

12. **වැදගත් .-** 2017.09.04 වැනි දින රා රේන්ද විකිණීමට නොහැකි වුවහොත් 2017.10.16 වැනි දින පෙරවරු 10.30 ට නැවත විකුණනු ලැබේ.

ඩබ්. එම්. ආර්. විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුර.

2017 ජූලි මස 21 වැනි දින.

08-359

---

**කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

2018 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද, දැනට බල පවත්නා සියලුම සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් ව 2017.09.22 වැනි දින පෙ.ව. 10.00 දක්වා ම විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද ලබාගැනීමට ඉදිරිපත්වන අය, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත උපලේඛනයෙහි දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා, ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද (අදාළ ටෙන්ඩරයේ සඳහන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක්) සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන ''තැබෑරුමේ අංකය හා නම ද'' පැහැදිලිව ලියා, ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, කටාන ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2017.09.22 වැනි දින පෙ.ව. 10.00 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කටාන ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2017.11.23 වැනි දින පෙ.ව. 10.30ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන් ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින, එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00ට පෙර කටාන ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක රේන්ද මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

කේ. ජී. එච්. එච්. ආර්. කිරිඇල්ල,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2017 ජූලි මස 25 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය - 2017**

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01. | මූකලන්ගමුව අංක 13 | කටාන | මූකලන්ගමුව ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000 | 2017.09.22<br>පෙ.ව. 10.30 |
| 02. | කටුනායක අංක 14 | කටාන | කටුනායක ගමේ පමණක් | පෙ. ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000 | 2017.09.22<br>පෙ.ව. 10.30 |
| 03. | ඇත්ගාල අංක 13 | කටාන | ඇත්ගාල ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 500 | 2017.09.22<br>පෙ.ව. 10.30 |
| 04. | නැ/කටාන අංක 24 | කටාන | නැ/කටාන ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2,000 | 2017.09.22<br>පෙ.ව. 10.30 |
| 05. | දෙමන්හන්දිය අංක 27 | කටාන | දෙමන්හන්දිය ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 2,000 | 2017.09.22<br>පෙ.ව. 10.30 |
| 06. | බම්බුකුලිය අංක 26 | කටාන | බම්බුකුලිය ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 1,000 | 2017.09.22<br>පෙ.ව. 10.30 |

08-402

---

ප්‍රා. ලේ./මිග/01/12/රා රේන්ද 2018.

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා පහත දක්වෙන තැබෑරුම්වලට 2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2017.09.21 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

2. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත්වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත සඳහන් ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසිය පරිදි ලබාගත් වත්කම් සහතිකය ද, (ඔබ ඉදිරිපත් කරන ටෙන්ඩර් වටිනාකමින් 15% කට නොඅඩු වත්කම් සහතිකපත්) ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2017.09.21 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

5. අදළ හා අත්‍යවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති අයදුම් පත්‍රයක් හෝ අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මා සතු වේ.

6. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2017.11.22 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් පත්‍රයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

7. "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප. ව. 3.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

8. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

9. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. කේ. ආර්. අලවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2017 ජූලි මස 28 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| තැබෑරුම් අංකය සහ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය | තැබෑරුම් විවෘත කරන වේලාව සහ තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| අංක 10 - සෙත්තපාඩුව | මීගමුව | සෙත්තපාඩුව පමණක් | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 5,000 | 2017.09.21 දින පෙ.ව.10.30 දක්වා |
| අංක 11 - බසියවත්ත | එම | බසියවත්ත පමණක් | එම | එම | එම |
| අංක 12 - පිටිපන | එම | පිටිපන පමණක් | එම | එම | එම |
| අංක 15 - කුරණ | එම | කුරණ පමණක් | එම | එම | එම |
| අංක 16 - කාමෝච්චෝඩය | එම | කාමෝච්චෝඩය පමණක් | එම | එම | එම |
| අංක 17 - උඩයාර්තෝප්පුව | එම | උඩයාර්තෝප්පුව පමණක් | එම | එම | එම |
| අංක 18 - කුඩාපාඩුව | එම | කුඩාපාඩුව පමණක් | එම | 1,000 | එම |
| අංක 19 - දළුපත | එම | දළුපත පමණක් | එම | 5,000 | එම |
| අංක 20 - පෝරුතොට | එම | පෝරුතොට පමණක් | එම | 3,000 | එම |
| අංක 21 - කොච්චිකඩේ | එම | කොච්චිකඩේ ගමේ පමණක් | එම 3,000 | එම | |
| අංක 22 - පළඟතුරය | එම | පළඟතුර පමණක් | එම | 1,500 | එම |

08-449

---

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2018 වර්ෂය සඳහා රා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල 2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතු ය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර, වගකීම් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැරහැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතූන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තව ද, සුරාබදු බලපත්‍ර දැරීම යටතේ සුරාබදු බලපත්‍රධාරින් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැලැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ දෙවසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් (රු. 5,000/-) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහළවකට (15%) නොඅඩු විය යුතු ය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත්කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තව ද, වත්කම් සහතිකයේ මුල් පිටපත දිසාපතිවරයෙකු/ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවක දී එම නිලධාරියා විසින් ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර, ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතු ය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවෙකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන් ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර, ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහතිකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. (මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ ගැසට් නිවේදනයේ පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. සීල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර්පත ඇතුළත් කවරයේ උඩ වම් පස කෙළවරේ "අංක ........................ දරන රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය - කොළඹ" යනුවෙන් සඳහන් කර (අ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ 2017.09.12 වැනි දිනට පෙර (ආ) ලියාපදිංචි තැපෑලෙන් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් රා තැබෑරුම් සඳහා බලපවත්වනු ලබන කොන්දේසි යටතේ දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී කාර්යාලයට පැමිණ සිටිය යුතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේ ම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

07. මිලයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ටෙන්ඩර්කරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වරදකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුළුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල් ආපසු දීම සහ ඉහත සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

08. 2017 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැළකිය යුතු ය.

**දැන්වීමයි**

අළුබෝමුල්ල, අරුග්ගොඩ ශ්‍රී ඉන්ද්‍රසාර මාවත පදිංචි තුඩුවගේ ලලිත් පෙරේරා විජේසේකර වන මා පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. ඒ. ජයන්ත කුමාර විසින් 2005 මාර්තු 23 වැනි දින ලියා සහතික කරන ලද අංක 1888 දරන රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොතේ 300 කාණ්ඩයේ 68 පත්‍රිරුවේ 6019 දින පොතේ අංකය යටතේ 2005 මැයි 13 යටතේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙස අළුබෝමුල්ල අරුග්ගොඩ ශ්‍රී ඉන්ද්‍රසාර මාවත පදිංචි තුඩුවගේ වනිතා පෙරේරා විජේසේකර යන අය පත්කර ඇති අතර, අද පටන් එය අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

තුඩුවගේ ලලිත් පෙරේරා විජේසේකර.

08-391

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : සොරබොර විලේජ් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123437
සමාගම සංස්ථාපනය කළ දිනය : 2017.06.28
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 40/1, දෙවෙනි රාජසිංහ මාවත, මහනුවර, ශ්‍රී ලංකාව.

ඩී. ජී. පුංචිහේවා,
සමාගම් ලේකම්.

08-392

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : ලංකා බීච් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123589
සමාගම සංස්ථාපනය කළ දිනය : 2017.07.04
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 84/1, පළඟතුරය - නැගෙනහිර, කොච්චිකඩේ.
සමාගම් ලේකම් : ඩබ්ලිව්. ටී. එච්. එම්. ප්‍රනාන්දු.

08-393

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : ලංකා නන් - වෝවන් පැකේජිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123532
සමාගම සංස්ථාපනය කළ දිනය : 2017.07.03
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : දඹුලු ඔය, දඹුල්ල, ශ්‍රී ලංකාව.
සමාගම් ලේකම් : නීතිඥ එස්. එම්. පී. බී. සිරිවර්ධන.

08-394

---

**දැන්වීමයි**

නම වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(8) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ කලින් තිබූ නම : ඔපෙක්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : ඔපෙක්ස් ඇග්‍රීන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 74, යුනියන් පෙදෙස, කොළඹ 02
සංස්ථාගත කළ දිනය : 2017 අප්‍රේල් මස 06 වැනි දින
ලියාපදිංචි අංකය : පී වී 12839

සමාගම් ලේකම්.

08-423

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) දරන ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී :-

සමාගමේ නම : ශ්‍රීපාලි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 123438
සංස්ථාගත කළ දිනය : 2017.06.28
ලියාපදිංචි ලිපිනය : අංක 36/9, සේනානායක මාවත, නාවල පාර, රාජගිරිය.

ලේකම්.

08-428

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) දරන ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : කැනඩා ලින්ක් වේ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 123037
සංස්ථාගත කළ දිනය : 2017.06.13
ලියාපදිංචි ලිපිනය : අංක 19/2, හේකිත්ත පාර, හැඳල, වත්තල.

ලේකම්.

08-429

---

**ප්‍රසිද්ධ නිවේදනය**

ආනන්දාස් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සංස්ථාපනය කළ දිනය : 2017 ජූනි 23
සමාගමේ අංකය : පීවී 123324
සමාගමේ නම : ආනන්දාස් ටෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 120, 3 වැනි හරස් වීදිය, කොළඹ 11.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

VELU RAJADURAI,
Secretary.

08-324

---

**ප්‍රසිද්ධ නිවේදනය**

ලීඩර් ඉලෙක්ට්‍රොනික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සංස්ථාපනය කිරීම පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සංස්ථාපනය කළ දිනය : 2017 මැයි 26
සමාගමේ අංකය : පීවී 122624
සමාගමේ නම : ලීඩර් ඉලෙක්ට්‍රොනික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 12, වජිර පාර, කොළඹ 04.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

08-329

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

විතාරන්දෙනිය බැදිගම පදිංචි හේවාසියාසිංහ පොල්ගහ මුල්ලගේ බේබිහාමි අංක 99, ගණේයාය ඇඹිලිපිටිය පදිංචි ජා.හැ.අ. 435171028V හේවාසියාසිංහ පොල්ගහ මුල්ගේ හීංහාමි හෙවත් හීන්හාමිනේ එකී ලිපිනයේම පදිංචි හේවාසියාසිංහ පොල්ගහ මුල්ලගේ එමලිහාමි ලෙල්ලොපිටිය කන්දඋඩබණ්ඩාරගේන පදිංචි ජා.හැ.අ. 506213487V හේවාසියාසිංහ පොල්ගහ මුල්ලගේ අමරාවතී අප විසින් හක්මන දෙනගම බටහිර නාමල්හි පදිංචි ජා.හැ.අ. 517930903V හේවාසියාසිංහ පොල්ගහ මුල්ලගේ ගිමාරහාමි වෙත ප්‍රදානය කරන ලද හක්මන ප්‍රසිද්ධ නොතාරිස් විසින් තර්ස්ටන් සමර ගුණරත්න මහතා විසින් ලියා සහතික කරන ලද 2016.11.28 දාතම 842 දරන විශේෂ ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ට කොට අවලංගු කරන ලද බැව් ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික ජනරජ ආණ්ඩුවටත්, පොදු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමු.

එච්. එස්. පී. බේබිහාමි, එච්. එස්. පී. අමරාවතී,
එච්. එස්. පී. හීංහාමි හෙවත්
හීන්හාමිනේ එච්. එස්. පී. එමලිහාමි.

08-431

---

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමයි**

(කලින් පදිංචි වී සිටි ඔස්ට්‍රේලියාව, 3178, වික්ටෝරියා, රෝවිල්, පෙනීක්‍රොස් කෝට්, අංක 09) සහ දැනට පදිංචිව සිටින ඔස්ට්‍රේලියාව, 3156, වික්ටෝරියා, ෆන්ට්‍රි ගලී, පරින්ග ඩ්‍රයිව්, අංක 23 හි පදිංචි දේවිකා නාමලී අධිකාරම් නොහොත් වික්‍රමනායක වන මා විසින් ශ්‍රී ලංකාවේ මහජනයා වෙත දැනුම් දී සිටින්නේ කොළඹ 05, කාස්සප පාර, අංක 52 හි පදිංචි පද්මා වික්‍රමනායක වෙත මා විසින් පවරා දෙන ලද දිමිත්‍රි පීරිස් යන ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2012.11.23 දිනැති දරන විශේෂ ඇටෝනි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බවටත් එම නිසා මෙතැන් පටන් පද්මා වික්‍රමනායක විසින් මා වෙනුවෙන් ගනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීමක් නොදරන බවත්ය.

දේවිකා නාමලී අධිකාරම් නොහොත් වික්‍රමනායක.

08-342

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඩබ්ලිව්එස්ආර් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2017 ජූලි 17
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 123732
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : හොරණ පාර, උඩෝවිට, නැබොඩ.

කේවයි ඇසෝසියේට්ස් පුද්ගලික සමාගම,
ලේකම්.

08-441

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

පොළොන්නරුව, පුලස්තිගම, බී. ඕ. පී. 313, කාලිංග ඇල හි පදිංචි වහුම්පුරයලාගේ සීතා රණසිංහ වන මම එන්. ඒ. රූපිකා දමයන්ති ප්‍රසිද්ධ නොතාරිස්තැන විසින් වර්ෂ 2016.08.01 වැනි දින ලියා සහතික කළ අංක 73 ඇටෝර්නි බලපත්‍රයෙන් රබෑව, සියඹලාව පන්සල පාර පදිංචි නන්දසේනගේ චන්දිමාල් ජානක නන්දසේන මහතාට දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කළ බව මෙයින් දන්වමි.

08-450

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

සමාගමේ නාමය : ඩ්‍රීම්ස් නර්සරි ඇන්ඩ් නෙස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 104476
සංස්ථාගත කළ දිනය : 2015 මාර්තු 16
ලියාපදිංචි කාර්යාලය : ''සැනසුම'', මුදලිවත්ත පාර, කඩුගන්නාව.

සමාගම් ලේකම්.

08-457

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සදර්න් ක්‍රෙඩිට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2017.07.20
සමාගමේ අංකය : පී. බී. 5404
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 200/2, වක්වැල්ල පාර, ගාල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග පරිදි,
සමාගම් ලේකම්.

08-465

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සොෆ්ට්ලයින් ඉංජිනියර්ඩ් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2017.07.21
සමාගමේ අංකය : පී. වී. 124075
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 492/බී, හල්ඹරාව හරස් පාර, හල්ඹරාව, තළාහේන, මාලඹේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්.

08-466

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සොෆ්ට්ලයින් ග්ලෝබල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2017.07.05
සමාගමේ අංකය : පී. වී. 123627
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 492/බී, හල්ඹරාව හරස් පාර, හල්ඹරාව, තළාහේන, මාලඹේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සමාගම් ලේකම්.

08-467

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : ඩබ්ලිව්. ඒ. එම්. ඉක්විප්මන්ට් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 123905
ලියාපදිංචි ලිපිනය : අංක 61, මල්වත්ත පාර, කොළඹ 07.

එම්. ඒ. ආර්. පෙරේරා,
සමාගම් ලේකම්.

08-471

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : සිනෝ ලින්ක්ස් කන්සල්ටන්සි ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී 122610
ලියාපදිංචි ලිපිනය : අංක 70, 2/1, 2 වන මහල, ලකී ප්ලාසා, කොළඹ 03.

අධ්‍යක්ෂකවරු.

08-472

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

හලාවත, කුරුණෑගල පාර, අංක 89/4 හි පදිංචි මිහිඳුකුලසූරිය ඈන් කිසන්තා ප්‍රනාන්දු වන මා විසින් හලාවත, කුරුණෑගල පාර, අංක 89/4 හි පදිංචි දල්පදෝරගේ එම්මානුවෙල් ලසන්ත වෙත ප්‍රදනය කරන ලද ඒ. ඩබ්. සාදිකුල් අමීන් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 2002.10.09 දිනැති අංක 628 දරන ඇටෝර්නි බලපත්‍රය මෙහි දින සිට අවලංගු වී අහෝසි වන අතර, එය බල පැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

එම්. ඒ. කිසන්තා ප්‍රනාන්දු.

2017 ජූලි මස 17 වැනි දින.

08-473

---

## රටබීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත්

ප්‍රා. ලේ./මීග/01/12/රා රේන්ද 2018.

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - විදේශ මත්පැන් රේන්දය විකිණීම - 2018 වර්ෂය**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව විදෙස් මත්පැන් විකිණීම සඳහා පහත දැක්වෙන තැබෑරුම්වලට 2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර්පත් 2017.09.21 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

2. විදෙස් මත්පැන් හල ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසිය පරිදි ලබාගත් වත්කම් සහතිකය ද, (ඔබ ඉදිරිපත් කරන ටෙන්ඩර් වටිනාකමින් 15%කට නොඅඩු වත්කම් සහතිකයක්), ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2017.09.21 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

5. අදාළ හා අත්‍යවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති අයදුම් පත්‍රයක් හෝ අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මා සතු වේ.

6. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ විදේශ මත්පැන් හල නැවත විකිණීම 2017.11.22 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් පත්‍රයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු ය.

7. "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප. ව. 3.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

8. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

9. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. කේ. ආර්. අලවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2017 ජූලි මස 28 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *තැබෑරුම් අංකය සහ නම* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කරන වේලාව සහ තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| අංක 02 - ග්‍රීන් බාර් (විදෙස් මත්පැන් හල) | මීගමුව | අංක 8 කොට්ඨාසයේ කුණ්ඩන්විල පමණක් | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 3,000 | 2017.09.21 දින පෙ.ව. 10.30 දක්වා |

08-448

---

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2018 වර්ෂය සඳහා රට බීම තැබෑරුම් රේන්ද විකිණීම

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශීක ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2018 ජනවාරි මස 01 වැනි දින සිට 2018 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

* 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,
* සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. සෑම ටෙන්ඩර්පත්‍රයක් ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු ය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර, වගකීම් පැහැරහැරී කොන්ත්‍රාත් නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැරහැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතුන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තව ද, සුරාබදු බලපත්‍ර දැරීම යටතේ සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැලැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ කවර විටක දී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ වසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි.

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් (රු. 5,000) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහලවකට (15%) නොඅඩු විය යුතුය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගුවන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත්කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය.

තව ද, වත්කම් සහතිකයේ මුල්පිටපත දිසාපතිවරයෙකු/ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවක දී එම නිලධාරියා විසින් ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතු ය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවෙකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන් ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහතිකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. (මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ ගැසට් නිවේදනයේ පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර්පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් පස කෙළවරේ "2018 වර්ෂයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ............................ දරන රට බීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය"යි යන්න සඳහන් ටෙන්ඩර්පත්‍ර 2017.09.13 වැනි දින පෙ. ව. 10.30 ට පෙර ලැබෙන සේ කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු යි.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේ ම ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රට බීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය.

07. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

08. ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

09. 2017 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් රේන්දය පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේ දී අංක 207 හා 1982 අගෝස්තු මස 20 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම යටතේ වූ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතු ය.

අනුමත කරන ලද කොන්දේසි හා රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ.

උපලේඛනයේ සඳහන් රටබීම තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන පොදු කොන්දේසි :-

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා හා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා වේ.
* තැබෑරුම වසන වේලාව ප. ව. 2.00 ප. ව. 5.00 දක්වා වේ.
* ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 5,000 කි.
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2017.09.13 වැනි දින පෙ. ව. 10.30 වේ.
* රට බීම තැබෑරුම් රේන්ද විකුණන දිනය 2017.09.13 වැනි දින පෙ. ව. 10.45 වේ.

**උපලේඛනය**

| *(ඒ) අනුක්‍රමික අංකය* | *(බී) ප්‍රදේශය* | *(සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* |
|---|---|---|
| 01. | අංක 01 කොට්ඨාසය කොටුව | *උතුරට* : ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට පල්ලිය වීදියේ මධ්‍ය රේඛාව හා ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට නැගෙනහිර දිශාවට ගිය විට එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා කෙලින් වීදියේ මධ්‍ය රේඛාව හමුවන බාන් ඔරලෝසු කණුව පිහිටි හන්දියේ මධ්‍ය ලක්ෂයේ සිට එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*නැගෙනහිරට* : එන්. එච්. එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට ඕල්කොට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*දකුණට* : දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හා ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට යොර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*බටහිරට* : ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද වේ. |
| 02. | අංක 2 කොට්ඨාසය මෝදර | *උතුරට* : පහළ ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හා ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට ඩිලාසල් වීදියේ මධ්‍ය රේඛාව හා මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන කෝවිල හන්දියේ පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*නැගෙනහිරට* : මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මෝදර පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමූණ කන්ද හතරමන් හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*දකුණ* : මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමූණ කන්ද හතරමන් හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට අලුත් මාවත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගියවිට පහළ ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද,<br><br>*බටහිරට* : අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හා පහළ ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට පහළ ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද වේ |

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.
12. **වැදගත් .-** 2017.09.13 වැනි දින විකිණීමට නොහැකි වූ රට බීම මත්පැන් තැබෑරුම් රේන්ද 2017.11.06 වැනි දින පෙ.ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

ඩී. පී. වික්‍රමසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2017 ජූලි මස 24 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-433/2.

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - රත්මලාන ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඈ" වගන්තිය යටතේ යෝජනා සම්මතය

වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම. (ඉඩම් කැබලි 2ක්)
(1) බස්නාහිර පළතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලයේ පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ, රත්මලාන ගමේ රජමාවත පිහිටියා වූ ද, වරිපනම් අංක 86/1, දරන 'මිදිගහඹිවිට' යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වල විසින් සාදන ලද අංක : 7036 හා 2008.02.06 දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස සලකුණු කොට නිරූපණය කර ඇත්තා වූද උතුරට : රජ මාවතේ වරිපනම් අංක 88/2 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : පාර ද, දකුණට : රජ මාවත වරිපනම් අංක 82, 84 හා 86 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : අඩි 20 ක් පළල පාර ද, මායිම් වන්නා වූද, එහි අංක 7036, දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම හතයි පහක් (අ.0, රූ.0, පර්.15.75) විශාල වූද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි හා වෙනත් සියලු දේත් ය. ලොට් අංක 01 ලෙස සලකුණු කළ ඉඩමේ කොටසේ නැගෙනහිර හා බටහිර මායිම් වශයෙන් එකී අංක 7036 දරන පිඹුරේ පෙන්වා ඇති මාර්ග තුළින් දිගේ හා උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් ය.

ඉහත දැක්වෙන ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලයේ පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව තුළ, රත්මලාන ගමේ රජමාවත පිහිටියා වූ ද, වරිපනම් අංක 86/1 දරන 'මිදිගහඹිවිට' යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා මහතා විසින් සාදන ලද අංක 327 හා 1984.09.19 දින දරන පිඹුරේ ලොට් අංක : B2 B ලෙස සලකුණු කොට නිරූපණය කර ඇත්තා වූද උතුරට : ලොට් අංක B2 A දරන කොටසද, නැගෙනහිරට : පාර ද, දකුණට : එම ඉඩමේ (ලොට් B2 ලෙස ලියා ඇතත්) ලොට් B3 දරන කොටස, රජ මාවත වරිපනම් අංක 82 හා 84 දරන පරිශ්‍ර ද, බස්නාහිරට : අඩි 20 ක් පළල පාර ද, මායිම් වන්නා වූද, එකී අංක 327, දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම හතයි පහක් (අ.0, රූ.0, පර්. 15.75) විශාල වූද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි හා වෙනත් සියලු දේත්ය.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2017 සැප්තැම්බර් මස 09 වැනි දින 10.30ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* රත්මලාන මැලිබන් හන්දියේ සිට ගාලු පාර ඔස්සේ රත්මලාන දෙසට මීටර් 100ක් පමණ යන විට දකුණු පසින් හමුවන රජ මාවතේ මීටර් 200ක් පමණ ගොස් වමට ඇති පාරේ මීටර් 200ක් පමණ ගොස් දකුණට ඇති අඩි 20ක් පමණ පළල පාරේ මීටර් 100 ක් පමණ යන විට පාරට මුහුණලා දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

(2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමාව තුළ ලක්ෂපතිය ගමේ පිහිටියා වූ ද "රදතොටනැල්ල දියපරගහදෙනිය" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් සාදන ලද අංක 3280B සහ 2008.02.01 දින දරන පිඹුරේ ලොට් අංක 06 ලෙස සලකුණු කොට නිරූපණය කර ඇත්තා වූද උතුරට : මෙහි ලොට් අංක 04 හා 05 ද, නැගෙනහිරට : මෙහි ලොට් අංක 05 හා ගාලු පාර ද, දකුණට මෙහි ලොට් අංක 07 ද, බස්නාහිරට මෙහි ලොට් අංක 07 හා 04 ද මායිම් වන්නා වූද එකී අංක 3280B දරන පිඹුරට අනුව පර්චස් විස්සක් (අ.0 රූ.0 පර්. 20.00) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත්ය.

ඉහත දැක්වෙන ලොට් අංක 06 දරන ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමයි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමාව තුළ ලක්ෂපතිය ගමේ පිහිටියා වූ ද " රදතොටනැල්ල දියපරගහදෙනිය" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. ජී. ඩී. අර්සකුලරත්න විසින් සාදන ලද අංක : 540 හා 2007.06.07 දින දරන පිඹුරේ ලොට් "B" ලෙස සලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : මෙහි ලොට් A දරන කොටස ද, නැගෙනහිරට : ගාලු පාර ද, දකුණට : ජුබිලි පාර ද, බස්නාහිරට : බැප්ටිස් දේවස්ථාන පරිශ්‍රය සහ බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් සාදන ලද 2991 දරන පිඹුරේ ලොට් අංක A දරන කොටස ද මායිම් වන්නා වූද, එකී අංක 540 දරන පිඹුරට අනුව රූඩ් තුනයි පර්චස් දහ අටයි දශම හයයි පහක් (අ.0 -රූ.03 - පර්.18.65) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත්ය.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2017 සැප්තැම්බර් මස 09 වැනි දින 12.30ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .- කටුබැද්ද හන්දියේ සිට ගාලු පාර ඔස්සේ කටුබැද්ද දෙසට මීටර් 200ක් පමණ යන විට ජුබිලි පාරට ආසන්නයේ පාරේ දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා 2016.02.05 දිනැති "දිනමිණ" හා "Daily News" පුවත්පත්වල පළමු වෙන්දේසි යෝජනාව සහ 2015.12.23 වැනි දින ගැසට් පත්‍රයට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවීම් කළ යුතු ය.

(01) ගැනුම් මිලෙන් 10%ක්
(02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්
(04) ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 500 ක්
(05) විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
(06) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී හයිලෙවල් පාර, නුගේගොඩ, අංක 117ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, (කොළඹ පිටත) ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතු ය.

දුරකතන අංක : 2768018, 2812260
ෆැක්ස් - 2817737

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වොත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා
තක්සේරුකරු, උසාවි කොමසාරිස් හා
දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03,
පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකතන අංක : 011-2810145/ 071-8021206

08-434/1

---

### මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඈ" වගන්තිය යටතේ යෝජනා සම්මතය

### වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ඇරැව්වල පිහිටියා වූ ද, අළුබෝගහවත්ත යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. ජී. ඩී. ඩී. ජයවර්ධන විසින් සාදන ලද අංක 682 හා 1989 නොවැම්බර් මස 18 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 2A ලෙස සලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : ධර්මසිංහගේ ඉඩමද, නැගෙනහිරට : ලොට් අංක : 2B ද, දකුණට : අංක 87 දරන පිඹුරේ (අඩි 15ක් පළල) ලොට් අංක 04 ද, බස්නාහිරට : අංක 87 දරන පිඹුරේ ලොට් අංක 01 ද මායිම් වන්නා වූ ද එකී අංක 682 දරන පිඹුරට අනුව පර්චස් දහයක් (අ:0 රූ.0 පර්.10) විශාල බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

පහත දැක්වෙන ඉඩම් කොටස් උඩින් මාර්ග ප්‍රවේශ අයිතිය සහ වෙනත් පොදු අයිතිවාසිකම් ද මීට ඇතුළත් වේ.

ඉහත කී ඇරැව්වල පිහිටියා වූද, අළුබෝවත්ත යයි කියනු ලබන ඉඩමේ ලොට් අංක 04, (අඩි 15 පළල පාර සඳහා වෙන් කිරීම) ලෙස සලකුණු කර ඇත්තා වූද, උතුරට : ලොට් අංක 01 හා 02 ද, නැගෙනහිරට : ලොට් අංක 03 ද දකුණට : එච්. ජී. ප්‍රේමතුංගගේ අංක 394 දරන පිඹුරේ ලොට් අංක 5, 6 හා 1A යන කොටස් ද, බස්නාහිරට : සුභ සාධක මාවත ද, මායිම් වන්නා වූද, බලයලත් මිනින්දෝරු ඩබ්. පී. ජී. ඩී. ඩී. ජයවර්ධන විසින් සාදන ලද අංක 87 හා 1983.09.11 දින දරන පිඹුරට අනුව පර්චස් දහයයි දශම නවයයි එකක් (අ.0, රූ.0, පර්. 10.91) විශාල වූ ද බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස නුගෙගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2835/252.240 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2017 සැප්තැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.30ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- මහරගම සිට පිළියන්දල පාරේ කිලෝමීටර් 03ක් පමණ ඉදිරියට ගිය විට හමුවන ඇරැව්වල මංසන්ධිය සහ ඇරැව්වල මහ විද්‍යාලය පසුකළ විට දකුණු පසට ඇති සුභසාධක මාවතේ මීටර් 200 ක් පමණ ගමන් කළ පසු වමට ඇති ගුරු පාරේ මීටර් 50 ක් පමණ ඉදිරියට ගිය විට පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා 2016.06.24 දින "දිනමිණ" සහ "ඩේලිනිව්ස්" පුවත්පත් හි පළකළ දැන්වීම සහ 2016.04.22 දින රජයේ ගැසට් පත්‍රයේ පළකළ දැන්වීම්වලට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(01) ගැනුම් මිලෙන් 10%ක්,
(02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
(03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
(04) ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 500 ක්,
(05) විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
(06) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී හයිලෙවල් පාර, නුගේගොඩ, අංක 117ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, (කොළඹ පිටත) ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතු ය.

දුරකතන අංක :011- 2812260, 011- 4305863
ෆැක්ස් අංකය : 011 - 2813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි ගෙවිය යුතු හිඟ මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා
තක්සේරුකරු, උසාවි කොමසාරිස් හා
දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03,
පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකතන අංක :071 -0821811/ 071-8021206.

08-434/2

---

### මහජන බැංකුව - මොරටුව ශාඛාව

### වටිනා ව්‍යාපාරික ගොඩනැගිලි සහිත දේපළ විකිණීමට

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඈ" වගන්තිය යටතේ යෝජනා සම්මතය.

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, මොරටුව, මහනගර සභා සීමාව තුළ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක "553C" උස්වත්ත ග්‍රාම නිලධාරි වසම ඇතුළත මොරටුවැල්ලේ පිහිටියා වූද, කලින් උස්වත්ත වටරවුම පාරේ වරිපනම් අංක 9/16 හා 9/17 දරන සහ දැන් නව ගාලු පාරේ වරිපනම් අංක 193/1 දරන "පයුරුගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ජේ. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 3627 හා 1992.04.09 දින දරන පිඹුරේ ලොට් "A" ලෙස ලකුණු කොට (එසේම බලයලත් මිනින්දෝරු ටී. එස්. ජී. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 176 හා 1989.07.10 දින දරන පිඹුරේ ලොට් "A1" හා "A2" ලෙස පෙන්නුම් කර ඇත.) නිරූපණය කර ඇත්තා වූද, උතුරට සහ නැගෙනහිරට : පාර සඳහා වෙන් කිරීම් ද දකුණට: එස්. එම්. දිසානායකට අයිති වරිපනම් අංක 9/3 දරන පරිශ්‍රයද බස්නාහිරට : කොළඹ සිට ගාල්ලට යන මහා මාර්ගයේ (නව ගාලු පාර) පදික වේදිකාවද මායිම් වන්නා වූද අංක 3627 දරන පිඹුරට අනුව, පර්චස් අටයි දශම දෙකයි හතක් (අ.0 රූ.0 පර්.8.27) හෙවත් හෙක්ටයාර් 0.020917 විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත්ය.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2017 සැප්තැම්බර් මස 02 වැනි දින පෙරවරු 10.30 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .- කොළඹ සිට ගාල්ල දෙසට යන ගාලුපාරේ මොරටු කුරුස හන්දියෙන් අරඹන නවගාලු පාරේ මීටර් 100 ක් පමණ ඉදිරියට යන විට හමුවන මහජන බැංකු මොරටු ශාඛාව ඉදිරිපිට නව ගාලු පාරට මායිම්ව පාරේ වම් පසින් වරිපනම් අංක 193/1 දරන පර්චස් 8.27 විශාලැති දේපළ හමුවේ.

2) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, පල්ලේපත්තුවේ, මොරටුව මහා නගරසභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 553C උස්වත්ත ග්‍රාම නිලධාරි වසම ඇතුළත මොරටුව චාර්ල්ස් ද සොයිසා පෙදෙසේ පිහිටියා වූද, "මාදන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ආර්. එල්. පෙරේරා විසින් සාදන ලද අංක 2303 හා 1982.01.22 දින දරන පිඹුරේ ලොට් "X" ලෙස සලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : බලයලත් මිනින්දෝරු එල්. ආර්. එල්. පෙරේරා විසින් සාදන ලද අංක 1094 හා 1971.01.20 දින දරන පිඹුරේ ලොට් අංක "A1" හා දරන "A2" දැනට නන්දවතී ද සිල්වා මහත්මියට අයත් කොටස් ද, නැගෙනහිරට : අංක 1094 දරන පිඹුරේ දැක්වෙන මෙම ඉඩමේ ලොට් "A3" හි කොටසක් සහ අංක 6198 දරන පිඹුරේ දැක්වෙන ලොට් "C5" හි කොටසක් ද, දකුණට : කලින් පීටර් සිල්වාට අයත්ව තිබූ දැනට ලෙස්ලි කුරේට අයත් මෙම ඉඩමේ ලොට් "C3" හි කොටසක් ද බස්නාහිරට : අඩි 10ක් පළල නගරසභා පාර ද මායිම් වන්නා වූ ද අංක 2303 දරන පිඹුරට අනුව පර්චස් 10 ක් (අ.0, රූ.0, පර්.10) විශාල වූ ද බෙදු වෙන් කරන ලද මුළු ඉඩම් සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත්ය.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් වර්ෂ 2017 සැප්තැම්බර් මස 02 වැනි දින 12.30 (දවල්) ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .- කොළඹ සිට ගාල්ල දෙසට යන ගාලුපාරේ, මොරටු කුරුස හන්දියෙන් පරණ ගාලුපාරේ පාර කිහිපයක් ඉදිරියට යන විට පාරේ වම් පසින් එම්. ජේ. සී. ප්‍රනාන්දු මාවත හමුවේ. එම මාවතේ "මෙත් මල් ෂොපින් සෙන්ටර්" පසු කර ඉදිරියට යන විට වම් පස පිහිටි චාර්ල්ස් ද සොයිසා මාවතේ වංගුව පසුකරන විට පාරේ දකුණු පසින් පර්චස් 10.0 විශාල දේපළ හමුවේ.

වැඩි විස්තර සඳහා - වෙන්දේසි යෝජනාව ප්‍රසිද්ධ කරමින් 2014.04.28 දිනැති "දිණමිණ" හා "Daily News" පුවත්පත් වල පළ වූ වෙන්දේසි යෝජනාව සහ 2013.12.06 දිනැති ගැසට් පත්‍රයට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවීම් කළ යුතු ය.

01) ගැණුම් මිලෙන් 10%ක්,
02) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
03) වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
04) ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 1,000 ක්,
05) විකුණුම් වියදම් සමඟ කොමිස් ගාස්තු වෙතොත් එම මුදල්ද,
06) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත දී හයිලෙවල් පාර, නුගේගොඩ, අංක 117ඒ හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමණාකරු (කොළඹ පිටත) වෙත ගෙවිය යුතු ය.

දුරකතන අංක : 2768018, 2812260.
ෆැක්ස් අංකය : 2817737.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා
තක්සේරුකරු, උසාවි කොමසාරිස් හා
දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03,
පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක :071 - 2810145/ 071-8021206

08-434/3

---

### සෙලාන් බැංකුව පීඑල්සී - ජා ඇල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපල ජා ඇල සිය ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 31451 ඇති 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඒන්ජල් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ජා ඇල බාලසූරිය අප්පුහාමිලාගේ ප්‍රෙස්සිටා පෙරේරා යන අය බන්ධනදායී / උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා ඇල නගර සීමාව තුළ වැලිග ම්පිටිය පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් සාදන ලද 2000.07.25 වැනි දිනැති අංක 6507 දරන සැලැස්මේ නිරූපණය වන වැවල පල්ලිය පාරෙහි වරිපනම් අංක 50, 50/1, සහ 50/ඒ දරන හල්ගහකුඹුර නැමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදු වෙන්කරන ලද ඉඩම් කොටස පර්චස් තිස් අටයි දශම හතයි පහක් (අ.0, රූ.0, පර්. 8.75) ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලුම දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපල 2017 සැප්තැම්බර් මස 06 වැනි දින පෙරවරු 11.30ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවසීම.*- ජා ඇල නගරයේ සිට කොළඹ - මීගමුව මාර්ගය ඔස්සේ කොළඹ දෙසට කි.මී. 1ට මඳකට වැඩි දුරක් ගොස් වැලිගම්පිටිය දක්වා පැමිණ දකුණුපසට ඇති වැවල පල්ලිය පාරට හැරෙන්න. එම මාර්ගය දිගේ තවත් මීටර් 150 ක පමණ දුරක් ගිය විට මාර්ගයේ දකුණුපසින් අදළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම - රජයේ ගැසට් පත්‍රයේ 2014.11.21 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත් වල 2014.11.07 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2014.10.30 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු හා සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පී.එල්.සී. වෙත ගෙවා නිමකල යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණි (නීති), සෙලාන් බැංකුව පී.එල්.සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011 2456473, 2456480.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011 3068185, 011-2572940

08-388

---

### මහජන බැංකුව - කිරිබත්ගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහර ප්‍රාදේශීය සභාවට අයත් දළුපිටිය ග්‍රාමයේ අඹගහවත්ත නමැති ඉඩමේ තෙමහල් ගොඩනැගිල්ලක් සහිත පර්. 11.20 ක (අක්.0, රූඩ් 0, පර්. 11.20) වටිනා බිම් කොටස මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017.08.30 වැනි දින පෙ.ව. 11.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ ගැසට් පත්‍රයේ, 2015.03.13 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ, සහ තිනකුරල් පුවත්පත්වල 2015.03.02 දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*- කොළඹ නුවර පාරේ කොළඹ සිට කි. මී. 14 ක් පමණ එනවිට මහර හන්දියෙන් වමට ඇති දළුපිටිය පාර හමුවේ. එම පාරේ කි. මී. 1.4 ක් පමණ ගියවිට පාරේ දකුණු පසින් ඇති 6 වන කි. මී. කණුවේ සිට මීටර් 50 ක් පමණ ගියවිට අදළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,500 ක්,
5. විකිණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත කළමනාකරු මහජන බැංකුව, කිරිබත්ගොඩ ශාඛාව වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033-222225, 033-2225008, 033-2231901.
ෆැක්ස් අංක : 033-2226165, 033-2226741.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 124 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176.
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-372

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී මගින් (මොරටුව ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. (ලියාපදිංචි අංක පීකිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 553 මොරටුවැල්ල දකුණු ග්‍රාම නිලධාරි වසමේ දිගරොල්ල සාන්ත පීටර් පාරේ වරිපනම් අංක 79/2 දරන "කහටගහවත්ත" නැමැති ඉඩමෙන් බෙදා වෙන්කරන ලද 2015 මාර්තු 27 වැනි දින බලයලත් මිනින්දෝරු එල්. පී. ලියනගේ විසින් සාදන ලද පිඹුරු අංක 1199A හි ලොට් ඒ

විශාලත්වය පර්චස් දහතයි දශම අටයි හතරක් (අ. 0, රූ.0, පර්. 17.84) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමඟ වේ.

පහත සඳහන් මාර්ග වෙන් කිරීම් මගින් නිදහසේ එහා මෙහා යෑමේ අයිතිය සමඟ වේ.

1. මතු දැක්වෙන දිගොරොල්ලේ පිහිටි "පල්මයිරා හවුස් වශයෙන් හඳුන්වන කහටගහවත්ත" ඉඩම බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු ජේ. විල්ෆ්‍රි රොඩ්රිගෝ විසින් 1998 පෙබරවාරි 05 වැනි දින සාදන ලද අංක 1759 හි දැක්වෙන 8, 11, 12, 15 සහ 16 යන ඉඩම් කැබල්ල.

විශාලත්වය පර්චස් දහතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්.17.5)

2. මතු දැක්වෙන දිගොරොල්ලේ පිහිටි "පල්මයිරා හවුස් වශයෙන් ද හඳුන්වන කහටගහවත්ත" ඉඩමේ බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් 2001 ජූලි 18 වැනි දින සාදන ලද අංක 1850 හි දැක්වෙන ලොට් 1 දරන බිම් කැබැල්ල

විශාලත්වය පර්චස් බිංදුවයි දශම හයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 0.62)

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේපත්තුවේ, මොරටුව මහ නගර සභා සීමාවේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 552A උයන දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මොරටුව උයන, උයන පාරේ වරිපනම් අංක 90/5 දරන ස්ථානයේ පිහිටි මෝදරපොළ මාදන්ගහවත්ත, ඇහැටුගහවත්ත මහපොළවත්ත හෙවත් මහපොළ මාදන්ගහවත්ත සහ මාදන්ග හවත්ත නැමැති ඉඩමෙන් මැන බෙදා වෙන්කරන ලද බලයලත් මිනින්දෝරු එල්. පී. ලියනගේ විසින් 2013 මැයි මස 22 වන දින සාදන ලද පිඹුරු අංක 704 හි දැක්වෙන ලොට් A.

ප්‍රමාණය පර්චස් දෙළහයි දශම එකයි බිංදුවක් (අ:0-රූ:0-පර්:12.10) ක් හෙවත් හෙක්ටයාර් 0.0306 විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

පහත සඳහන් මාර්ග වෙන් කිරීම් මතුපිටින් නිදහසේ එහා මෙහා යෑමේ අයිතිය සමඟ වේ.

1. මතු සඳහන් උයන පිහිටි මෝදරපොළ මාදන්ගහවත්ත ඇහැටුගහවත්ත, මහපොළවත්ත හෙවත් මහපොළ මාදන්ගහවත්ත සහ මාදන්ගහවත්ත නැමැති ඉඩම බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු එල්. පී. ලියනගේ විසින් 2013 මැයි මස 22 වැනි දින සාදන ලද පිඹුරු අංක 704 දරන පිඹුරේ ලොට් B දරන

ප්‍රමාණය පර්චස් බිංදුවයි දශම නමයයි බිංදුවක් (අ.0, රූ.0, පර්. 0.90) හෙවත් හෙක්ටයාර් 0.0023

2. මතු සඳහන් දිගරොල්ලේ පිහිටි "පල්මයිරා හවුස් වශයෙන්ද හඳුන්වන කහටගහවත්ත" ඉඩමේ බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. එල්. ද සිල්වා විසින් 1959 සැප්තැම්බර් 20 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 6679 සහ බලයලත් මිනින්දෝරු එස්. ලියනගේ විසින් 1987 දෙසැම්බර් මස 20 වන දින මැන සාදන ලද ලොට් F දරන ඉඩම් කොටස.

ප්‍රමාණය පර්චස් දොළහක් (අ:0-රූ:0-පර්:0.12) හෙවත් හෙක්ටයාර් 0.03035

පානදුර පල්ලියමුල්ල, සිරිනිවාසාරාම පාරේ අංක 267/11B යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ සමාගම් නීති යටතේ විධිමත් අන්දමින් ස්ථාපිත සමාගමක් වන ඉසුරු ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ සුවඳ ආරච්චිගේ සනත් කුමාර උකස්කරු ලෙසද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත 1 සහ 2 උපලේඛනවල සඳහන් දේපළ

1 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ. 0, රූ.0, පර්.17.84) වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 31 වැනි දින පෙ.ව. 11.30 ට

2 වන උපලේඛනයේ සඳහන් දේපළ (අ. 0, රූ.0, පර්.12.10) වර්ෂ 2017 ක්වූ අගෝස්තු මස 31 වැනි දින ප.ව. 12.30 ට මා විසින් ඉහත ස්ථානවලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.07.07 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.08.11 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2017.08.11 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩම්වලට පිවිසීම :-

*1 වන උපලේඛනය සඳහන් දේපළ :*

කොළඹ සිට ගාලු පාරේ කි. මී. 18.5 ක් පමණ ගමන් කර මොරටුව කුරුස හංදියට පැමිණ එතැනින් වමට තිබෙන මහා වීදිය ඔස්සේ කි. මී. 1 ක් පමණ ගියවිට දිගරොල්ල පාලම හමුවේ. ඒතැනින් කෙළින්ම ඇති මෝදර පාරේ (ශාන්ත පීතර පාර ලෙසද හැඳින්වේ) එම පාරේ මීටර් 400 ක් පමණ ගමන් කළ විට ජනජය විද්‍යාලය නමින් නාම පුවරුවක් ඇත. (දකුණු අත පැත්තේ) ඒතැනින් වමට ඇති අඩි 20 ක් පළල පාරේ මීටර් 100 ක් පමණ ගමන් කළවිට එම පාරේ රියක් හැරවීමේ කුඩාම කවයක් ඇත. සවයර් ප්ලෑන් එකේ පෙන්වා ඇති පරිදි එම අදාළ දේපල පිවිසුම් මාර්ගයේ මායිම් දකුණු අත පැත්තේ පිහිටා ඇත. පිවිසුම් මාර්ගය අවසානයේ තේරුවක් ලෙස පිහිටා ඇත. වර්තමානයේ මෙය ගොඩනැගිල්ලේ කොටසකින් ආවරණය වී ඇත.

*2 වන උපලේඛනය සඳහන් දේපළ.-*

කොළඹ සිට ගාලු පාරේ කි.මී. 17.5 ක් පමණ ගමන් කළ විට රාවතාවත්ත හංදිය හමුවේ. ඒ තැනින් දකුණට ඇති ලුනාව දුම්රියපොළ පාරේ කි. මී. 1 ක් පමණ ගමන් කළවිට වමට ඇති උයන පාරේ මීටර් 400 ක් පමණ ගමන් කර දකුණට හැරුණු විට තිබෙන අඩි 10 ක් පළල බොරළු පරේ මීටර් 75 ක් පමණ ගමන් කළවිට අදාළ දේපළ වම් අත පැත්තේ ඉදිරියෙන් සඳහන් කර ඇති ගමන් මාර්ගය අවසානයේ පිහිටා ඇත. සර්වයර් ප්ලෑනේ පෙන්වා ඇති පරිදි එම ගමන් මාර්ගයේ වමට ඇති ප්‍රපාතාකාර වංගුවේ පිහිටා ඇත. එකී ගේට්ටුවේ අංක 106/23 ලෙස සඳහන් කර ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකිණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ මොරටුව ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011-2445393
ඊමේල් senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී,
අංක 766, ගාලු පාර, ඉඩම
මොරටුව.
දුරකථන අංක : 011-2643084-6, 011-5555331
ෆැක්ස් අංකය : 011-2643087

08-455

---

**සම්පත් බැංකුව පි. එල්. සී.**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩී. එම්. සී. එන්. සී. දිසානායක
ගිණුම් අංකය : 0113 5000 2997

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රාදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2017.04.27 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි හතලිස් අට ලක්ෂ හැට හතර දහස් අනූ නමයක (රු. 1,48,64,099) මුදල ද, 2017 අප්‍රේල් 12 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන තෙක්, රුපියල් එක් කෝටි විසි තුන් ලක්ෂ අසූ පන් දහස් හයසිය හැත්තෑ නමයයි ශත තිස් හතරක (රු. 1,23,85,679.34) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ ගාස්තුද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2017.06.23 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2017.06.19 වැනි දින ''දිවයින'', සහ ''තිනකුරල්'' සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2017.08.29 වැනි දින පෙ.ව 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ මහපලාත කෝරළේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ හපුතලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අඹේගොඩ, 67 - C ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මැටිපිම්බිය ග්‍රාමයේ පිහිටි "WYE එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට (එම මානක තැන විසින් 2014 මැයි මස 02 දින නැවත මැන සීමා මායිම් සනාථ කරන ලද) බලයලත් මානක තැන පි. ඩබ්ලිව්. නන්දසේන යන අය විසින් සාදන ලද 1996 ජනවාරි 20 වැනි දතම හා අංක 969 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ගම් සහා පාර, නැගෙනහිරටඃ : එම ඉඩමේ ඉතිරි කොටස (අංක 566 දරන පිඹුරේ ලොට් 1) දකුණට : කඳුර සහ බස්නාහිරට : කඳුර යන යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අඃ 0, රූඃ 0, පර්ඃ 10) හෝ හෙක්ටයාර් 0.026 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී අංක 969 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව V 06/112 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

08-463

---

HNB 252-17 (1)

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - දික්වැල්ල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. පිණිදිය විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද, 2011.08.10 අංක 1961 සහ මාතර ප්‍රසිද්ධ නොතාරිස් 'යූ.එන්.චන්ද්‍රලතා' විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2015.03.30, දිනැති සහ අංක 8562 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකු කමදි හැන්නැදිගේ සුජිත් අනුර යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ,හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2017 ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පෙ.ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකණනු ලැබේ.

*දේපළ.-* දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොඩම්පහල ග්‍රාම නිලධාරි වසමේ, දොඩම්පහළ, උඩවෙල හි පිහිටි උතුරු කොටසේ, ජයවර්ධන කංකානම්ගේ ගෙදරවත්ත සහ රත්නායක ආරච්චිගේ පාලුවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එන්. ජාගොඩ විසින් 1971 ඔක්තෝබර් 24 වැනි දින පිළියෙල කරන ලද අංක 922 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස සහ එහි ඇති සියලු දේත් සමග වේ. විශාලත්වය රූඩ් තුනයි පර්චස් තිස් එක (අ. 0. රූ. 3. පර්.31) කි.

ඉහත සඳහන් ඉඩම නැවත මැනීමෙකින් පසු මෙසේ විස්තර කෙරේ.

*දේපල.-* දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, දෙඩම් පහල (උඩවෙල) හි පිහිටි උතුරු කොටසේ, ජයවර්ධන කංකානම්ගේ ගෙදරවත්ත සහ රත්නායක ආරච්චිගේ පාලුවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් 2006 මැයි 08 වැනි දින පිළියෙල කරන ලද අංක 2262 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් අංක 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස සහ එහි ඇති සියලු දේත් සමග වේ. විශාලත්වය රූඩ් තුනයි පර්චස් විසිහතයි (අ. 0 රූ. 3 පර්. 27) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග පස වගාවන් සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ. බලයලත් මිනින්දෝරු ඩබ්. එන්. ජාගොඩ විසින් 1971 ඔක්තෝබර් 24 වැනි දින පිළියෙල කරන ලද අංක 922 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් අංක 3 සහ බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් 2006 ජුනි මස 20 දින පිළියෙල කරන ලද අංක 2279 දරන පිඹුරේ ලොට් 5 සහ බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් 2011 ජුනි මස 05 වැනි දින පිළියෙල කරන ලද අංක 1742 දරන පිඹුරේ ලොට් 1 සහ බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් 2006 ජුනි මස 20 වැනි දින පිළියෙල කරන ලද අංක 2279 දරන පිඹුරේ ලොට් 5 දරන මාර්ගයේ යාමේ ඇති අයිතිය සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2017.07.07 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2017.07.11 වැනි දින ලක්බිම, තිනකුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම .-*දික්වැල්ල නගර මධ්‍යයේ සිට මහවෙල පාරේ දොඩම්පහළ හන්දිය දක්වා කිලෝ මීටර 1.5 ක් පමණ ගමන් කරන්න. එම පාරේම බෝගහ හන්දිය දක්වා මීටර 300 ක් පමණ ඉදිරියට යන්න. දකුණට ඇති කොන්ක්‍රීට් අතුරා ඇති පාරේ මීටර 300 ක් ගමන් කොට වමට ඇති අතුරු පාරට හැරී මීටර් 125 ක් පමණ ගමන් කරන්න. දකුණට ඇති අඩි 12 පළල පාරේ මීටර 60 ක් පමණ ගිය විට දේපළට ළඟා විය හැකිය. එය පාරේ කෙළවරේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය .-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවූවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු : (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක. 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක - 0777 378441/ 0714 424478
ෆැක්ස් - 0112 - 509442

08-384

---

**I කොටස : II (ආ)ඡෙදය යටතේ පළවන ඉතිරි දැන්වීම් සහ I කොටස : I ඡෙදය යටතේ පළවන සියලු දැන්වීම් 2017.08.11 දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk